# මැතිවරණ ව්‍යාපාරවල දේශපාලන සන්නිවේදන උපක්‍රමයක් ලෙස ගීත භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්.එම්.එල්.කේ. විජේනායක[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

## සංක්ෂේපය

මැතිරණ ව්‍යාපාරයක් යනු ජනාධිපතිවරණය, මහා මැතිවරණය හෝ ජනමත විචාරණයකදී, පළාත් සභා මැතිවරණයකදී හෝ ප්‍රාදේශීය සභා මැතිවරණයකදී මහ ජනතාව දැනුවත් කිරීම සඳහා පක්ෂ විසින් භාවිතයට ගන්නා ක්‍රමවේදයයි. එම ක්‍රියාවලිය නොමැතිනම් ඡන්දදායකයින් මෙන්ම අපේක්ෂකයින්ද දුෂ්කරතාවලට මුහුණ දේ. මැතිවරණ ව්‍යාපාරයකදී අපේක්ෂක වගතුග මහජනතාව වෙත සන්නිවේදනය කිරිම සඳහ විවිධ උපක්‍රම භාවිතා කරයි. පෝස්ටර්, කටවුට්, වෙළඳ දැන්වීම්, ප්‍රසංග, පෙළපාලි, රැස්වීම් ආදිය ඉන් කිහිපයකි. වර්තමානයේ මැතිවරණ ව්‍යාපාරය සඳහා උපයෝගී කර ගන්නා ප්‍රබලතම මෙවලම වන්නේ බහුජන මාධ්‍යයයි. පුවත්පත්, රූපවාහිණී, ගුවන් විදුලිය හා අන්තර්ජාලය ඔස්සේ විකාශනය කරන්නා වූ තොරතුරු හරහා ඡන්ද දායකයින් අදාළ අපේක්ෂකයාගේ ප්‍රතිරූපය, පසුගිය වාර්තා, ජනතා සේවය ඉදිරි සැලසුම් ආදිය පිළිබඳව දැනුවත් වේ. විද්‍යුත් බහුජන මාධ්‍ය ඔස්සේ මෙන්ම ප්‍රසංග රැස්වීම් ආදියෙහි සන්නිවේදන උපක්‍රමයක් ලෙස භාවිතා කරන ප්‍රබලතම ක්‍රියාමාර්ගයක් වන්නේ අදාළ අපේක්ෂකයා සම්බන්ධ ගීත නිර්මාණ භාවිතා කිරිමයි. ගීතය ප්‍රබලතම සන්නිවේදන උපක්‍රමයක් වීමට බලපාන ලද කාරණය වන්නේ ගීතයේ ඇති ආකර්ෂණය හැකියාව සහ හැඟීම් දනවීමේ හැකියාවයි. මැතිවරණ ව්‍යාපාරවල යොදා ගන්නා උපක්‍රමයක් වන ගීත භාවිතාය ජනතා මතය හැඩගැස්වීමට කෙතෙක් දුරට සාර්ථක වී තිබේද? ගීත මගින් සන්නිවේදන කාර්යයක් ඉටුවේද? යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මේ සඳහා 2015 ජනාධිපතිවරණය සහ 2015 මහා මැතිවරණ ව්‍යාපාර තුළ දී භාවිතා කළ ගීත පිළිබඳව විශ්ලේෂණයක යෙදුණු අතර අධ්‍යයන ඡන්දදායකයින්ගේ අදහස් විමසා බැලීමට ක්ෂේත්‍රය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලුක්වත්ත ග්‍රාම නිළධාරී වසමෙහි ඡන්දදායක නාමලේඛනය ඇසුරින් ඡන්දදායකයින් 100ක් අහඹු ලෙස තෝරා ගැණිනි. එමෙන්ම සංගීතඥයින් සමඟ පැවැත්වූ අතර එමගින් මැතිවරණ ව්‍යාපාරය තුළ දේශපාලන සන්නිවේදනය සඳහා ගීත යොදා ගැනිම පිළිබඳව විමර්ශනය කෙරිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූයේ ගීත මගින් දේශපාලන සන්නිවේදනය සිදුවන බව ප්‍රතිචාරින්ගෙන් 91% ද, ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස එය ඵලදායි බව ප්‍රතිචාරීන්ගෙන් 76% ප්‍රකාශ කළහ.

**මුඛ්‍ය පද ඃ** *දේශපාලන සන්නිවේදනය, මැතිවරණ ව්‍යාපාරය, ප්‍රචාරක උපක්‍රම, ගීත*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk